# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 29 දරන ආහාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2011 ජුනි මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 ජුනි මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **4.00 යි.** තැපැල් ගාස්තුව **:** රු. **5.00 යි.**

**2011 අංක 29 දරන ආහාර (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2011 ජුනි මස 07 වන දින]

එල්.ඩී.—ඕ. 26/2009.

**1980 අංක 26 දරන ආහාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක 29 දරන ආහාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1980 අංක 26 දරන පනතේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 26 දරන ආහාර පනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ආහාර උපදේශක කමිටුව.

8 (1) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ආහාර උපදේශක කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම්—

(i) කමිටුවේ සභාපතිවරයා විය යුතු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ii) කමිටුවේ ලේකම්වරයා විය යුතු සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ආහාර පාලන කටයුතු පරිපාලනය භාර අධ්‍යක්ෂවරයා;

(iii) මහජන සෞඛ්‍ය සේවා භාර නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරු දෙදෙනෙක්;

(iv) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ආහාර පාලන කටයුතු පරිපාලනය භාරව සිටින සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙක්;

(v) රජයේ රස පරීක්ෂකවරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

PL 005485—3,340(2011/02)

(vi) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(vii) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙක් ;

(viii) 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(ix) වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(x) සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(xi) කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා;

(xii) කොළඹ මහ නගර සභාවේ නාගරික රස පරීක්ෂකවරයා;

(xiii) ආහාර කොමසාරිස්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(xiv) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පෝෂණ විද්‍යාඥයෙක්;

(xv) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නීති නිලධරයා; සහ

(ආ) පහත දැක්වෙන නම්කළ සාමාජිකයන්, එනම්—

(i) පළාත් පාලන සහ පළාත් සභා විෂයය භාරව කටයුතු කරන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධරයෙක්;

(ii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ආහාර ශිල්පඥයෙක්;

(iii) අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන ආහාර ක්ෂුද්‍ර ජීවී විද්‍යාඥයෙක්;

(iv) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ආහාර විද්‍යාඥයෙක්;

(v) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ආහාරවලට අදාළ වාණිජ සම්බන්ධතා නියෝජනය කරන සාමාජිකයෙක්;

(vi) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ආහාරවලට අදාළ කර්මාන්තවල සම්බන්ධතා නියෝජනය කරන සාමාජිකයෙක්; සහ

(vii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ආහාරවලට අදාළ පාරිභෝගික සම්බන්ධතා නියෝජනය කරන සාමාජිකයන් දෙදෙනෙක්.

(2) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන කමිටුවේ සෑම සාමාජිකයකු ම ඉල්ලා අස්වීම, මරණය හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතුකොටගෙන කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ඔහු නම් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, නැවත නම් කරනු ලැබීම සඳහා ද ඔහු සුදුස්සකු වන්නේ ය.

(3) කමිටුවේ නිල බලයෙන් පත්වූ සෑම සාමාජිකයකු ම ඔහු කමිටුවේ සාමාජිකයකු වීම සඳහා හෝ සාමාජිකයකු වශයෙන් නම් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබූ යම් ධුරයක් දැරීම අවසන්වීමේ දී, ඔහු කමිටුවේ සාමාජිකයකු වීම ද අවසන් වන්නේ ය.

(4) කමිටුවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එවැනි සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම යන කරුණු නොතකා කමිටුව විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කරනු ලැබිය හැකිය.

(5) කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතු ය:

එසේ වුව ද, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රශ්න විසඳීම පහසු කිරීම සඳහා යම් තැනැත්තකු පැමිණ සිටීම අවශ්‍ය වන්නේ නම්, එවැනි තැනැත්තකුට කමිටුවේ රැස්වීමකට සහභාගි වන ලෙස කමිටුවේ එකඟත්වය ඇතිව ප්‍රධාන ආහාර බලධරයා විසින් ආරාධනා කළ හැකි ය :

එසේ ම තවදුරටත් එවැනි ආරාධිත සාමාජිකයන්ගේ පැමිණීම මගින් රැස්වීමට අවශ්‍ය ගණපූරණය සංයුක්ත කරනු නොලැබිය යුතු ය :

එසේ ම තවදුරටත්, එවැනි යම් රැස්වීමක දී සාකච්ඡා කරනු ලබන යම් කාරණයක් පිළිබඳව ඡන්දය දීමට එසේ ආරාධනය කරනු ලැබූ තැනැත්තාට අයිතියක් නොතිබිය යුතු ය.

(6) කමිටුවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්වකීය කාර්ය පටිපාටිය, කමිටුව විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව විධිමත් කරනු ලැබිය හැකිය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.